සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

71 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# සිංහල I

කාලය පැය තුනයි

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. **පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) සතරමහමුහුද පැන් විතරටත් බොහෝව යනාදීන් අතමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සේ ශෝක දුඃඛය තුනී නියාව දැකලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පාටාචාරාවෙනි, දෙමව්පිය ආදී හු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු යැ'යි වදාරා විසිවන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළ සේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්‍ය්‍ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාර දෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොවී සැපතට ලොවුතුරාසැපතුන් යම්තම් විතරක් ලත්හ. සෙසුත් බොහෝ දෙන සෝවාන්ඵලාදියට පැමිණියහ.

(i) පටාචාරාවන්ගේ ශෝක දුක තුනී වූයේ කුමක් ඇසෙන විට ද?
(ii) බුදුරජාණන් වහන්සේ පටාචාරාවන්ට ආමන්ත්‍රණය කළේ කුමන අවස්ථාවේ ද?
(iii) කතුවරයා පටාචාරාවන් ගෙවා දැමූ කෙලෙස්වල ප්‍රමාණය මෙහි දක්වා ඇත්තේ කෙලෙසක ද?
(iv) පටාචාරා තමන්ගේ උපත පිරිසිදු කරගනු ලැබුවේ කෙලෙසක ද? (ලකුණු 4යි)

(ආ) පරීක්ෂාකාරී නොවන කටයුත ඇති හිතපක්ෂ මුමාත්‍යයන් නොවිචාරා කටයුතු කාරිය නොදන්නා අඥාන මන්ත්‍රීගේ මන්ත්‍රණයෙහි පවත්නාහු පොරණ සැලපටය (සැලවට) හැර යන සර්පයා මෙන් ශ්‍රී කාන්තාව ඔහු හැර යන්නීය. තව ද මෙකී සියලු දෝෂයන් වැළකී කායද්වාරාදියෙන් අකුසල් නොකොට කරන රාජ්‍යධූරයෙහි ප්‍රමාද නොව මේ වේලාවට මේවා කළමනා කටයුතු යැ'යි පරීක්ෂාකාරීව දවසරිනාහු රජ හට සියලු සැපත්හු පෙරඬමස සඳ සෙයින් දවසින් දවස වඩනාහ. මෙපරිද්දෙන් රජහට අවවාද දී දිව්‍ය පුත්‍ර කියනුයේ 'මහරජ' තොපගේ දෝෂ තොපි මේ යයි නොදකුව'යි පිටිනුවර අප්‍රසිද්ධ වේශයෙන් ඒ ඒ තැන ඇවිද රජ්ජුරුවන් වහන්සේ මෙබඳු ගුණ ඇති සේකැ'යි නුගුණ ඇති සේකැයි වත් කියන සත්ත්වයන්ගේ බස් අසා තත් වූ පරිද්දෙන් දැන රාජ්‍ය විචාරා වසව'යි අවවාද දී අන්තර්ධාන වූයේය.

(i) ශ්‍රී කාන්තාව විසින් අත්හරිනු ලබන්නේ කුමන ගති ලක්ෂණ ඇත්තවුන් ද?
(ii) රජ තනතුරේ කටයුතු කළ යුත්තේ කෙලෙසක ද?
(iii) 'පෙරමඬස සඳ සේ' වර්ධනය වන්නේ මොනවා ද?
(iv) 'සැලපටය' 'අන්තර්ධාන' යන වචනවල අර්ථ දක්වන්න. (ලකුණු 4යි)

(ඉ) ඉක්බිති කම්රතිසසයෝ රාත්‍රිභාගයෙහි සවප්නයක් දක්නාහු තමන්ගේ ගෙට ගිනිකඳ අටක් අවුත් වදනා දැක එම ඇසිල්ලෙහි පිබිද 'අද මාගේ මනදොළ මුදුන් පැමිණෙන්නේ වනැ'යි සන්තොෂ ව උදාසන් ම තමන් වසන ගෙය සුවඳ පිරිබඩ ගෙන උඩ සුදුවියන් බැඳ වට වැට පහන් ලවා සුවඳ දුම් ලවා පූර්ණඝට කෙහෙල් තොරණ ආදියෙන් සරහා ලද පස්මල් ඉස ආසන අටක් පනවා තමන් හිඳිනා ගෙදොර පටන් ගම් දොර දක්වා මඟදිග වළ ගොඩ සම කොට බෙර ඇසක් සේ තනා කළු වැලි පියා සුදු වැල්ලෙන් තවරා සපු කිනිහිරි දෑ සමන් ආදි නන් පැහැ ඇති සුවඳ මල් ඉස මඟ සරසා රහතුන් වහන්සේ වඩනා පෙරමග බල බලා ගම්දොර සිටියහ.

(i) කර්මාරතිස්ස තම අපේක්ෂා ඉටුවන බව පසක් කරගනු ලැබුවේ කුමක් නිමිති කරගෙන ද?
(ii) 'බෙර ඇසක් සේ' යන්නෙහි උපමේය කුමක් ද?
(iii) කර්මාරාතිස්සයන් පෙර මග බලා සිටියේ කුමන බලාපොරොත්තුවෙන් ද?
(iv) 'පිරිබඩ' 'පූර්ණඝට' යන වචනවල අර්ථ දක්වන්න. (ලකුණු 4යි)

(ඊ) දිව සර කය රුසිරින් පෑ දන සකය
සැදි අලකය ඇඳි නළලතෙහි තිලකය
සිටි නිසැකය ළඳ කොමළඟනන් දැකය
පරතර කය වැද යව මග නොවැළකය

එළි කොට අවට රිවි බට සිඳු මැඳුරතට
එක විට ලොවට එළි බට ගන්දර කඳට
රොස කොට යුදට අඹ රට සඳ එන කලට
වැලි තොට ගමට ලැගුමට ගොස් මග නොසිට

(i) චන්ද්‍රයා යුධ වැදීමට සූදානම් වන්නේ කවරකු හා සමඟ ද?
(ii) සූර්යයා ගමන් කළේ කුමන ස්ථානයකට ද?
(iii) **'එළි කොට අවට රිවි බට සිඳු මැඳුරතට'** යන්නෙහි අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?
(iv) 'දිවසර', රොස කොට' යන පදවල අර්ථ දක්වන්න. (ලකුණු 04 යි)

(උ) පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **''හතරක''** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) ''තොපි කෙරෙහි අතිශයින් විශ්වාසීය''
(ii) ''එතකොට මට වයස අවුරුදු අටයි.''
(iii) ''ඇසිල්ලකුත් මෙතන නො රඳ ව, ලුහුබඳවා පුව මැනවැ'යි''
(iv) ''තෙපි කා කුමක් කරා දැ'යි''
(v) ''කතුහලටය පත් වුණු මමත් ඒ ගැන විමසල බැලුවා''
(vi) ''ඒ වුණත් අපේ ගේ දැක්කම පුදුම වේවි'' (ලකුණු 8 යි)

(උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ **රසාස්වාදයක්** කරන්න.

පුතු නළවනු පිණිසැ කට බොරු මැ කිය කියා
හොට ඇනැ බිඳින සේ උකුණන් අතරැ පියා
පිසැගෙනැ කඳුළු යළි ඇසි පිය හොඳට අයා
සිඳුවත ඇස ඇයට හිමි රුව පෙනී ගියා

ඉඩ හැරැ පැනැ ගියෙනෙ' විටැ බිය සෝ දෙන්නා
බුරමින් නැගිණි දැලි ලා වැඩි කෝ ගින්නා
සිහි කොටැ එදා ගිනි රස හොඳට මැ දන්නා
එය වළකනුව දිවැගති ඉන් උගු දුන්නා

නටන සෙ ඇංජිමක් බසයෙකැ ගමනැ සැදූ
පැනැ පැනැ ගැගෙන හද තද කොටැගෙනැ පුරුදූ
සැර කැපුමැති'ති වදන් හිත් වදිනට මැ යෙදූ
හොට මැදැගෙනැ සැදූ ඕ මඟ ඇසින් රුදූ

බත් සැළියක් බඳු වැ ළං වූ උතුරන ට
අඩු කොටැගනුව ළය සැරසී සිටි ඇය ට
ළං වුණු බස් ඇසෙන පමණට හිමි රුව ට
වන් ලෙස ඇසිණි හෙණයක් සක්වළ ගල ට

'සිතා ගෙදොරැ නැති විලසක් අඹු ද රුවන්
නටා ගසා ගොස් එන සැටි රැගෙනැ රුවන්
අහා! වැරැදුණා කට මගෙ ඇස'ඳු රුවන්
පියා නො වේ ඒ මෙහි එන්නැ පොඩි රුවන්'' (ලකුණු 16යි)

02. අවස්ථාවට උචිත රසභාවයන් දැනවීමට සමත් භාෂාවක් යොදා ගැනීම නිසා සද්ධර්මරත්නාවලිය පාඨක සම්භාවනාවට පාත්‍ර වී තිබේ. නිර්දිෂ්ට කථා වස්තු ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

නැතහොත්

ස්ත්‍රී චෛතසික සම්භාවයන් මනා ලෙස විවරණය කර දැක්වීමට ජාතක කතා කතුවරයා සමත් වී තිබේ. නියමිත කථා වස්තු දෙකක් ඇසුරින් විමසුමක යෙදෙන්න. (ලකුණු 15යි)

03. ''සද්ධර්මාලංකාරය එවක සමාජයේ පැවති සමාජ, සංස්කෘතික හා ආර්ථික තොරතුරු රැසක් හෙළි කරයි.' නියමිත කථා වස්තු ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි)

04. තත් කාලීන සමාජයේ වැදගත් ඓතිහාසික හා සමාජීය තොරතුරු රාශියක් ගිරා සංදේශ කාව්‍යයෙන් හෙළි වේ. නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 15යි)

05. තම ආත්මාර්ථකාමී ආපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම කෙරෙහි ම අවධානය යොමු කළ දෙවොංදරා සා නොරිකො සං ව ඇසුරු කළේ ද එම පරමාර්ථයෙන් ම ය. මළගිය ඇත්තේ නවකතාව ඇසුරින් විමසන්න.

(ලකුණු 15යි)

06. වැඩිහිටියන්ගේ අදූරදර්ශී ක්‍රියාකාරකම් හේතුවෙන් වියැකී යන සුන්දර ළමා ලෝකය පිළිබඳ විවරණයක් කිරීමට කෙටිකතාකරුවා උත්සුක වී ඇති අයුරු අභිමත කෙටිකතා තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 15යි)

07. සරල සංසිද්ධීන් පාදක කොටගෙන ගැඹුරු ජීවන අත්දැකීම් විවරණය කිරීමට නූතන කවීන් සමත්ව ඇති අයුරු අභිමත පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15යි)

08. රත්නාවලී නාට්‍යයේ එන සාගරිකා සහෘදයාගේ අනුකම්පාවට පාත්‍ර වන්නේ අනපේක්ෂිත බලවේග හමුවේ ඇ අසරණ වන නිසාය. නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................ සිංහල II කාලය පැය තුනයි

- **I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරුපත් සමග අමුණා භාර දෙන්න.**

## Iකොටස

01. එක් එක් ප්‍රශ්නයට **වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන** එයට හිමි අංකය වරහන තුළ යොදන්න.

1.1 **ඔ ඕ ඖ** යන අක්ෂර සැලකෙනුයේ කුමන අක්ෂර ලෙස ද?
(1) තාලුජ (2) ඕෂ්ඨජ (3) කණ්ඨෞෂ්ඨජ
(4) කණ්ඨ තාලුජ (5) දන්තෞෂ්ඨජ (.....)

1.2 **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) ෂඩ්වර්න, චන්දස, අනුස්මරනය, මූලෝත්පාඨනය, භාශිතය
(2) අනුස්මරණය, ෂඩ්වර්ණ, මූලෝත්පාඨනය, ඡන්දස, භාෂිතය
(3) මුලෝත්පාඨනය, ෂඩ්වර්ණ, චන්දස, අනුස්මරණය, භාසිතය
(4) ෂඩ්වර්ණ, ඡන්දස, අනුස්මරණය, භාෂිතය, මූලෝත්පාටනය
(5) භාශිතය, ෂඩ්වර්ණ, අනුස්මරනය, ඡන්දස, මුලෝත්පාටනය (.....)

1.3 **අකාරාදී පිළිවෙළ අනුව** නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) බණ්ඩාරගම, බණ්ඩාරවෙල, බතලගොඩ, බොගවන්තලාව
(2) යක්විල, යටියන්තොට, යාපනය, යාපහුව
(3) ගන්දර, ගම්පොළ, ගංගොඩවිල, ගල්ගමුව
(4) මන්නාරම, මීගමුව, මොණරාගල, මත්තල
(5) රත්මලාන, රත්නපුරය, රද්දොළුව, රම්බොඩ (.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) විසර්ගය සඳහා පිල්ලම් යෙදිය හැකි ය.
(2) ගාත්‍රාක්ෂරයකට පසුව ද විසර්ගය භාවිත වේ.
(3) විසර්ගය භාවිතයේ දී ස්වරයක පිහිට අවශ්‍ය ම නො වේ.
(4) වචනයක පවතින ස්වරයකට පූර්වයෙන් ද විසර්ගය භාවිත වේ.
(5) විසර්ගය උච්චාරණයේ දී 'හ්' ශබ්දයක් වේගයෙන් පිට වේ.

1.5 **ගයනුකිත්ත, රකාරාංශය, රේඵය, හා යංශය** සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පේළිය තෝරන්න.
(1) ගෞරවය, අතික්‍රමණය, පූර්වභාග, මිථ්‍යාව
(2) ප්‍රාමාණික, ලෞකික, හේත්වර්ථ, සුබනම්‍ය
(3) සුප්‍රකට, ගර්වය, නෞකාව, අභ්‍යුදය
(4) කර්ණාභරණ, ඖචිත්‍ය, පරිභ්‍රමණය, සෞන්දර්ය
(5) මෛත්‍රිය, විසර්ගය, කෞතුක, අනම්‍ය (.....)

1.6 **එකිනෙකට අනුරූප වන සේ** වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) ජීවන මාර්ගය, සංසාර සයුර, අහස් යාත්‍රාව, මිථ්‍යා ප්‍රබන්ධ
(2) අඹු සැමි, සුර ගඟ, සිළුමිණි සෑය, මග වැනුම්
(3) නිසල විල, නාවික යාත්‍රාව, දේශීය චින්තය, සැහැසි අපරාධ
(4) මෘග රාජයා, ශාඛ පත්‍ර, සිව්රඟ සේනාව, අනාථ නිවාසය
(5) ශීත ඍතුව, චන්ද්‍ර පාෂාණ, අමෘත පානය, මිනිස් වාසය (.....)

1.7 **තත්සම වචන පමණක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) නිර්ධන, සැණකෙළි, සහෘද, භූපති
(2) විහඟ, චංචල, රාවය, බන්ධන
(3) පශ්චාත්තාපය, රූපනය, අරණ, ඉන්ද්‍ර
(4) වාණිජ, ලාලිත, භාෂිත, කායික
(5) ප්‍රවර, ලෝචන, සරතැස, වෘක්ෂය (.....)

1.8 මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ඉදිරිය - පිටුපස, පශ්චාත්, පශ්චිම, පසුපස
(2) ශෝභන - අවලස්සන, අශෝභන, අසුන්දර, කැත
(3) පරාජය - දිනුම, ජය, දිය, විජය
(4) නින්දාව - ප්‍රශංසාව, යස, කීර්තිය, පැසසුම
(5) අනලස් - කම්මැලි, අලස, කුසීත, නිහීන (.....)

1.9 මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක් ඇතුළත්** නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිරිකත - ලක්ෂ්මී, මුහුදු දූ, පියමම්බා, වෙණුකල්
(2) යුගල - යුග්ම, බාන, ගෙය, සඟළ
(3) දෙරණ - ධරණී, දියත, වසුන්දරා, වසුමතී
(4) ආයාසය - උත්සුක, ප්‍රයත්න, තැත, ප්‍රයාස
(5) විශාල - තුමුල, නැබල, හබල, විපුල (.....)

1.10 **සම්බන්ධ, ආධාර, අවධි කරණ, සම්ප්‍රදාන** යන **විභක්ති සමාස** පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) බ්‍රහ්මලෝකය. ආකාශගංගාව, පිංපඩිය, මිණිකිරුළ, මුහුදුජීවින්
(2) පිංපඩිය, මිණිකිරුළ, ආකාශගංගාව, මුහුදුජීවීන්, බ්‍රහ්මලෝකය
(3) බ්‍රහ්මලෝක, මුහුදුජීවින්, මිණිකිරුළ, ආකාශගංගාව, පිංපඩිය
(4) බ්‍රහ්මලෝකය, මුහුදුජීවින්, ආකාශගංගාව, මිණිකිරුළ, පිංපඩිය
(5) ආකාශගංගාව, මිණිකිරුළ, පිංපඩිය, මුහුදුජීවීන්, බ්‍රහ්මලෝකය (.....)

1.11 **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) රැවුම්, ගෙරවුම්, උණුසුම්, විමසුම්
(2) වැගිරෙන, වැපිරෙන, මැතිරෙන, හැරවෙන
(3) කඩන, පෙරන, බලන, දකින
(4) සිතූ, පැතූ, ලියූ, කියූ
(5) කළ, උගුළ, වගුළ, මතුළ (.....)

1.12 පහත සඳහන් උද්ධෘතවල **තද කළු** අකුරෙන් මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

*ළසල් රුකෙක **සැතපෙව** ළපලු සිහිලළ

***අසමින්** ගී රස මියුරු

***නටා ගසා** ගොස් එන හැටි රැගෙන රුවන්

*නේත්, අඳුරන්න බැහැ මල් **පිපෙද්දී**

(1) විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(2) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) විධික්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා
(4) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා
(5) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා (.....)

1.13 **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) බාලිකාවක්, දක්ෂයකු, බිරිඳක්, නටවන්නෙක්
(2) කෙනෙක්, ගුරුළුගෝමීන්, මෙරුවන්, බ්‍රාහ්මණයින්
(3) සංචාරකයෝ, නීතීහු, අප, සර්පයෙක්
(4) පර්වතයෝ, කම්කරුවන්, අන්ධයෝ, කවීහු
(5) ගවයකු, ඔවුහු, ගැහැනියක, ගෙම්බෙක් (.....)

1.14 **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) නිශ්ශබ්ද, නිමල, අවවාද, අනුකාරක
(2) සම්භාවනා, ප්‍රවාද, සුලලිත, අභිචාර
(3) දුගඳ, දුදන, දුහුල, දුහද
(4) අබිනික්මන, උද්ග්‍රහණය, උත්තුංග, සංතාපය
(5) අපහරණය, සම්පූර්ණ, දුර්මුඛ, අනාරාධනා (.....)

1.15 **සාහිත්‍යෝන්නතිය** උදෙසා **ගත්කරුවන්** දැක්වූ දායකත්වය **අතිවිශිෂ්ට** වේ. යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) උපසර්ග, විභක්ති හා සන්ධි
(2) සන්ධි, විභක්ති හා උපසර්ග
(3) විභක්ති, උපසර්ග හා සන්ධි
(4) සන්ධි, උපසර්ග හා විභක්ති
(5) විභක්ති, සන්ධි හා උපසර්ග (.....)

1.16 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන පදයක්** ඇති වරණය කුමක් ද?
(1) ආදර්ශවත්, අසිරිමත්, වෘද්ධතර, විශිෂ්ටතම
(2) ඉදුම්හිටුම්, ඉනඉහ, අපාදෙපා, සැරවැර
(3) වෙළඳාණෝ, සෙබළාණෝ, ඇදුරාණෝ, එදිරිවීරයෝ
(4) මෙන්, සේ, බඳු, විය
(5) ලියනය, අතුරනය, රඳවනය, කඩනය (.....)

1.17 **එකම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) අත්‍යුදාර, අත්‍යවශ්‍ය, බහ්වර්ථ, ලෝකෝපකාරය
(2) වක්කඩ, වප්පිහිය, අග්ගලා, අස්සන
(3) ලංකේශ්වර, සජ්ජන, ප්‍රබන්ධෝපදේශ, මෘගේන්ද්‍ර
(4) පරමාදර්ශය, ජනානන්ද, අන්වර්ථ, ශරීරාවයව
(5) සිතුවම්, දඩයම්, සිතියම්, පන්නම් (.....)

1.18 **සමාසයක් නො වන පදයක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) මුවකමල, ලෝනා, මනමැඳුර, මිණිනුවන්
(2) පැණිවරකා, බිංපොල්, රටදෙල්, ඇත්තෝර
(3) සුවිනීත, සුනෙර, සුගායනීය, සුජාත
(4) පුටුකකුල, සුරලොව, කුරුළුපිහාටු, රාජාසනය
(5) පස්කම්, අටකොන, දසදිසාව, නවනින්දා (.....)

1.19 **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය** තෝරන්න.

(1) මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය හෝ පාලම විවෘත කළේ ය.
(2) දරුවෝ බිම වැටෙති'යි මව බිය වූවා ය.
(3) බොහෝවිට අලසයෝ දුප්පතුන් වෙති.
(4) මෙවර ජයග්‍රාහකයන් බස්නාහිර පළාතෙන්
(5) ගොළුවන් බිහිරන් සේ බැණ නොනැඟී සිටුව (.....)

1.20 **වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත** වාක්‍ය තෝරන්න.

(1) කවරම ලේඛකයකු වුවද තම කුසලතා මුලින්ම මුදාහරින්නේ රචනා මගින්ය.
(2) සිංහලයෙ හි පද අතර සිදුවන සන්ධිදහයක් ඇතිබව පිළි ගැනේ.
(3) ආර්ථික කටයුතු කාර්යක්ෂම ව හැසිරවීමට ශ්‍රී ලංකාවේ පැරැන්නන් කටයුතු කර ඇත.
(4) රටපාලනය සඳහාද කාන්තාවන් තෝරාගැනීමට අපේ පැරණි සමාජය කටයුතු කරතිබේ.
(5) දේශපාලනබලය මධ්‍යගතවීම යනු රට එක් සේසත් කිරීමයන අදහසට සමානවේ. (.....)

## II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය කියවා **අසා ඇති ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.

මධ්‍යතන යුගයේ සියලු ශිල්පීන් සංවිධානය වී සිටියේ ශ්‍රේණි වශයෙනි. මේ නිසා මෙකල බිහි වූ නිර්මාණ ''ශ්‍රේණිවල'' නමින් හැඳින්වීය. එමෙන් ම කලා ශිල්ප ආගමට නැඹුරු වීම ද විශේෂ ලක්‍ෂණයකි. කලා කෘතිවලට අනුග්‍රහ දැක්වේමේ ශක්තිය පල්ලිය පමණක් තිබීමත්, මධ්‍යකාලීන චින්තනය ආගමික ඉගැන්වීම් පදනම් කොට ගොඩ නැගී තිබීමත් මෙයට හේතුව විය. මේ නිසා කලාකරුවන්ට තම ශක්තියට අනුව ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොතිබුණි. එහෙත් පුනරුද සමයේ මේ සියල්ල වෙනස් විය. කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ලෞකික රස වින්දනය අගය කරන ධනවත්තු ඉදිරිපත් වූහ. පුනරුද සමයේ අගය කරන ලද පුද්ගලවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් කලාකරුවෝ ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරීමට පටන් ගත්හ. එහෙත් ශ්‍රේණිවල නමින් හැඳින්වූ කලා කෘති ඒවා නිර්මාණය කළ කර්තෘන්ගේ නමින් එළි දැක්වීමට කටයුතු කෙරණි. මේ නිසා ආගමික සිතිවිලිවලට මුල් තැන දීම වෙනුවට පෞද්ගලිකත්වය ඉස්මතු කෙරෙන ලෞලික රස වින්දනයට මුල් තැන දුන් කලා කෘති රාශියක් බිහි විය.

(i) කලා ශිල්ප ආගමික මුහුණුවරක් ගැනීමට තුඩු දුන් හේතු මොනවා ද?
(ii) කලාකරුවන්ට ස්වාධීන වීමට නොහැකි වූයේ ඇයි?
(iii) පුද්ගලවාදයේ ප්‍රතිඵලය කුමක් වූයේ ද?
(iv) ලෞකික රස වින්දනයට මුල් තැන දුන් කෘති බිහි වූයේ කෙසේ ද?
(v) කලාකරුවන්ට ස්වාධීන වීමට අනුග්‍රහ දැක්වූවෝ කවරහු ද? (ලකුණු 10යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන** සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ගවේෂණයට නැතහොත් අනාවරණයට ඉඩ සැලසීම ද ඉගෙනීමේ කටයුතු රසවත් ව සංවිධානය කිරීමට හේතු වේ. සතුන් හා මිනිසුන් අතර ඉගෙනීම සම්බන්ධයෙන් දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්‍ෂණය නම් ගැටලු විසඳීමේ හැකියාව සම්බන්ධයෙන් දෙවර්ගය අතර පවත්නා වෙනස්කම් ය. ගැටලු විසඳීමට අවශ්‍ය ගවේෂණය හා තර්කානුකූල චින්තනය සතුන් අතර ද තරමක් දුරට තිබුණත් මිනිසුන් අතර ඉහළ මට්ටමකින් දක්නට ලැබෙයි. මේ නිසා කරුණු ගවේෂණයට හෙවත් අනාවරණයට මග පාදන අන්දමේ ඉගෙනුම් අවස්ථා සංවිධානය කිරීම අවශ්‍යය.

අනාවරණ ඉගෙනීම සම්බන්ධයෙන් වැදගත් අදහස් පළ කොට ඇති වර්තමාන මනෝවිද්‍යාඥයකු නම් ජෙරම් බෲනර් ය. ඔහු දක්වන අන්දමට තොරතුරු සකස් කොට සංවිධානය කොට ඉදිරිපත් කරනාවට වඩා අනාවරණය හෙවත් ගවේෂණය තුළින් ළමයින්ට තොරතුරු ලබා ගැනීමට සැලසීම යෝග්‍ය ය. ජීන් ජැක් රූසෝ පවා සඳහන් කොට ඇති මේ අනාවරණ ඉගෙනුම සම්බන්ධයෙන් වඩාත් වැදගත් අදහස් බෲනර් විසින් ඉදිරිපත් කර තිබේ. අර්ථාන්විත ඉගෙනුමක් ළමයින් තුළ ඇති කළ යුතු බව දක්වන බෲනර් ඒ සඳහා කට පාඩම් කිරීම හෝ රැස්කොට තිබෙන දැනුම් සම්භාරය ශිෂ්‍යයන්ට සම්ප්‍රේෂණය කිරීම හෝ ඵලදායී නො වන බව දක්වයි. ශිෂ්ටාචාරයේ මුල සිට ම මිනිසා පරිසරය හා ගැටෙන්නට ලැබෙන අවස්ථාව හේතු කොට ගෙන වඩා අර්ථවත් ඉගෙනුමකට ඉඩ ප්‍රස්තාව ලැබෙයි. එමෙන් ම අනාවරණ ඉගෙනුමකට අවස්ථාව සැලසීමෙන් ළමයින් තුළ ගැටලු විසඳීමට අවශ්‍ය ප්‍රතිවේද පහළ වීමට ඉඩ සැලසිය හැකි ය.

03. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව **වචන 300-350 වන සේ විශ්ලේෂණාත්මක** රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. උද්ඝෝෂණ හා වැඩවර්ජන හමුවේ පසුබසින ආර්ථිකය
2. අධ්‍යාපන පෞද්ගලිකකරණයේ වාසි - අවාසි
3. අසමතුලිත කාලගුණික වෙනස්වීම් නිසා පීඩාවට පත්වන ජන ජීවිතය
4. ශ්‍රී ලංකාවේ ආර්ථිකය හසුරුවන ජාත්‍යන්තර බලපෑම්
5. කාර්මීකරණය හමුවේ කඩා වැටෙන කෘෂිකර්මාන්තය
6. අනාගතය ගැන සිතා කළ යුතු ආර්ථික කළමනාකරණය (ලකුණු 25යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) සංවිධායකයන් සියල්ලෝ ම සභාපතිගේ තීරණයට එකඟ වූහ.

(ii) තුරුලතාවන් ඇද වැටෙද්දී වනසත්තු බිය වූහ.

(iii) කලාකරුවන් ජනමන පුබුදු කරති.

(iv) ධනවතකු ලෙස ජීවත් වූ අමරසිරි දිළින්දෙක් ලෙස මිය ගියේ ය.

(v) සෑම අපරාධකරුවෙක් ම යම් සාක්ෂියක් ඉතිරි කරනු ඇත. (ලකුණු 5යි)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) නාගරිකයෝ දිළින්දන්ට ආහාර බෙදා දෙති.

(ii) ඇදුරාණෝ තම සිසුන් අන්‍යයන්ට හඳුන්වා දෙති.

(iii) වෙළෙන්දෝ අයුතු ලාභ ලබමින් භාණ්ඩ විකුණූහ.

(iv) මීමැස්සෝ නැවුම් පුෂ්පයන් සිපගනිති.

(v) වෛද්‍යවරයෙක් රෝගියා පරීක්‍ෂා කළේ ය. (ලකුණු 5යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා **සුදුසු පදය** වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කම්කරුවෝ / කම්කරුවන්) වර්ජනය නවතා වැඩට පැමිණෙව්.

(ii) සිඟන්නා ද සැරයටිය ද ඉවතට වීසි (විය / වූහ)

(iii) වෙළෙන්දා නොහොත් වෙළෙන්දිය පළතුරු (විකුණුවා ය / විකුණුවේ ය)

(iv) සිරගත වූ (මිනිසුන් / මිනිස්සු) නිදහස් වන්නේ කවදා ද?

(v) (අපි / අප) රට වෙනුවෙන් වැඩ කිරීම වටී. (ලකුණු 5යි)

05. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) මහමග ගමන් ගත් තරුණයා **ජාත්‍යන්ධයෙක්** විය.

(ii) **නිරවශේෂ** ව දුන් දානයෙන් බොහෝ ආනිසංස ලැබේ.

(iii) **පරුපවාද** හමුවේ නොසැලී සිටීම උතුම් ගුණයකි. (ලකුණු 1 x 3 = 3)

(ආ) පහත සඳහන් යෙදුම්වල **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) බැහැර කළ රාගය ඇති

(ii) සිතුවම් ඇඳි රෙද්ද

(iii) පරාජය කිරිමට අසමත් වූ (ලකුණු 1 x 3 = 3)

(ඉ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට **වඩාත් ම ගැළපෙන** පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ගුරුවරුන්ගේ සේවයට ................................................ දැක්වීමට ශිෂ්‍යයෝ කටයුතු කළහ.

(ii) සෙබළුන්ගේ ............................................ පිළිගැනීමට ආඥාපති සූදානම් විය.

(iii) දේශකයාගේ දේශනයට ....................................... දැක්වීමට කිසිවෙක් ඉදිරිපත් නොවූහ.

(iv) වෛද්‍යවරයා දුන් උපදෙස්වලට රෝගියා ..................................................... විය.

(v) ගායකයා ගැයූ ගීතය ........................................................... නැංවීය.

(vi) අවන්හලේ ආහාර පිළිබඳ ................................................................. විය නොහැකි බව ඇතැම්හු පැවසූහ.

(½ x 6 = 03)

(ප්‍රතිරාවය, උත්තමාචාර, ප්‍රියමනාප, ප්‍රතිචාර, කෘතඥ, උපහාර) (ලකුණු 3යි)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පද යොදා** **වෙනත් අරුතක් දෙන** වාක්‍ය බැගින් තනන්න.

(i) අමුත්තන්ට **අසුන්** පැනවීම දුෂ්කර කටයුත්තක් විය.

(ii) වැව් අමුණු ප්‍රතිසංස්කරණය **කල්** නොයවා කළ යුත්තකි.

(iii) පොහොය **දා** පන්සල් බිම මහ සෙනගින් පිරුණි.

(iv) කබල මත තිබූ කුරහන් රොටිය **කර** වී තිබුණි.

(v) හිරු **මද** රත් පැහැයෙන් යුක්ත ව බැස ගියේ ය.

(vi) තරුණයාගේ ප්‍රයත්නයට **උර** දිමට කිසිවෙක් ඉදිරිපත් නොවූහ. (ලකුණු 1 x 6 = 6)

06. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය** දක්වන්න.

(i) රියෙහි **බඳින** ලද ගොනා රිය **ද** ඇදගෙන **හතිලමින්** දිව ගියේ ය.
(බඳින - කෘදන්ත, ද - නිපාත, හතිලමින් - ක්‍රියා)

(ii) **ඇදුරාණෝ මව්පිය** උපස්ථානයේ අගය **සිසුන්ට** පැහැදිලි කළහ.
(ඇදුරාණෝ - තද්ධිත, මව්පිය - සමාස, සිසුන්ට - විභක්ති)

(iii) **ගුණවත් මාර්ගෝපදේශකයා** සංචාරකයින්ට **සීගිරිචිත්‍ර** පෙන්වී ය.
(ගුණවත් - තද්ධිත, මාර්ගෝපදේශකයා - සන්ධි, සීගිරිචිත්‍ර - සමාස)

(iv) අකලට **වට** මහ**වැස්සෙන් ගංවතුර** තත්ත්වයක් ඇති විය.
(වට - කෘදන්ත, වැස්සෙන් - විභක්ති, ගංවතුර - සන්ධි)

(v) **සුදුමල්** වට්ටියක් අතින් **ගෙන දැරියක්** විහාරයට ගියාය.
(සුදුමල් - සමාස, ගෙන - ක්‍රියා, දැරියක් - තද්ධිත) (ලකුණු 3x5 = 15)

07. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් **ගැළපෙන ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(i) පිහිටක් පැතූ තැනින් විපතක් සිදු වීම.

(ii) පරිසරය වෙනස් වුවත් ගතිස්වභාව වෙනස් නොවීම.

(iii) විශාල වරදක් කළ අයෙකුට කුඩා වරදක් එතරම් නො වේ.

(iv) කඩින් කඩ යමක් සිදුවීම.

(v) අවස්ථාවට අනුව කටයුතු කිරීම. (½ x 6 = 03)

(vi) ප්‍රයෝජනයකට ගත නොහැකි දෙයක් පරිත්‍යාග කිරීම. (ලකුණු 3)

(ආ) පහත දී ඇති රූඩීවල **අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

| | | |
|---|---|---|
| (i) උඩගෙඩි දෙනවා | (ii) මඩගහනවා | (iii) අං ඇවිල්ලා |
| (iv) අතදිග හැර | (v) අර අදිනවා | (vi) අතපල්ලෙන් වැටුණු |

(½ x 6 = 03)
(ලකුණු 3)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද **සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

| | | |
|---|---|---|
| (i) කටේ - දිවේ | (ii) අල්ලාප - සල්ලාප | (iii) ආවා - නාවා |
| (iv) මැහුම් - ගෙතුම් | (v) කතා - බතා | (vi) තාන්න - මාන්න |

(½ x 6 = 03)
(ලකුණු 3)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ** යෙදෙන පද ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| (i) ආඟිරිය | (ii) කිඩහැල්ල | (iii) පුස්සනවා |
| (iv) වහංවෙනවා | (v) කැරැස්සා | (vi) හේරුවක් |

(½ x 6 = 03)
(ලකුණු 3)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දියහැකි පොදු භාවිතයේ** යෙදෙන අරුත් ලියන්න.

| | | |
|---|---|---|
| (i) ගැදැල්ල ගානවා | (ii) ලියන්නාව | (iii) දියදුන්න |
| (iv) පාවරය | (v) කොට්ටෝරුවා | (vi) හම්බන් |

(½ x 6 = 03)
(ලකුණු 3යි)

08. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ස්වකීයජීවිතයපිළිබඳවූකල්හිඉවසිල්ලෙන්තීරණයකොටගෙනස්ථිරාධිෂ්ඨානයෙන්ස්ථානෝචිතලෙසක්‍රියාරම්භකිරීමෙහිසුරුබුහුටිබවනම්ස්ත්‍රීන්විෂයයෙහිනිසර්ගවශයෙන්පවත්නාබලයකිඡ්හෙයින්මේපවත්නාපුදුමප්‍රවෘත්තියෙන්මේනොකල්හිරපුගේපැමිණීමපිළිබඳප්‍රවෘත්තියෙන්මොහොතක්පමණකල්වික්ෂිප්තියෙන්බලාසිටඔව්ඔව්අපඅතරද්‍රෝහියෙක්සිටියිනැත්නම්කිසිකලෙකත්මේඅදිසියේමටකලින්නොදන්වාරජුටමෙහිපැමිණෙන්නටකිසිදයුතුකමක්නැතිදැන්දැන්වැඩහුඟක්දුරටමවරදිවියිහුදකලාවමතොල්මතුරමින්ඉතින්මිත්‍රවරුනිමෙයමාබලාපොරොත්තුනූවූඅදිසියකිමේමොහොතේදීරජුමෙහිපැමිණීමසියල්ලන්ටමනරකක්වන්නටපුළුවනිඑහෙයින්තොපමෙහිසැඟවීසිටිව්යිකියමින්ඇඹවුන්රැගෙනගොස්යාබදකාමරයකදමාදොරවැසුවාය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට. අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **නිසර්ග** යන පදය **රේඵය** යොදා නැවත ලියන්න.

(iii) **ප්‍රවෘත්තියෙන්** යන පදයේ **ස්වර හා ව්‍යඤ්ජන** වෙන්කර ලියන්න.

(iv) **ද්‍රෝහියෙක්** යන පදයෙහි ඇති පිල්ලම් නම් කරන්න.

(v) **දන්තජ, අඝෝෂ හා ඝෝෂ මහප්‍රාණාක්ෂර** යෙදී ඇති පදයක් ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 15යි)

# තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය 2018 - සිංහල I

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (අ)(i) අනමතග්ගපරියාය සූත්‍රය ඇසෙන විට
(ii) පටාචාරාවගේ ශෝක දුක තුනීවීමෙන් පසුව
(iii)පොළොව පස් විතර
(iv)ශිල විශුද්ධ කොට ගෙන ජීවත්වීමෙනි. (ලකුණු 4යි)

(ආ)(i) පරීක්ෂාකාරී නොවන වැඩිහිටියන් නොවිමසා අඥාන මන්ත්‍රීන්ගේ වචන පිළිනොගෙන කටයුතුකරන අය
(ii) කායද්වාරාදියෙන් අකුෂල් නොකොට
(iii)සියලු සැප
(iv)සැලපටය - හැව, අන්තර්ධාන - අතුරුදහන් (ලකුණු 4යි)

(ඉ)(i) ස්වප්නයක් දැකීමෙනි. / ගිනි කඳ අටක් ගෙට ඇතුල්වන අයුරු සිහිනෙන් දැකීම.
(ii) නිවසේ සිට ගම් දොර දක්වා වන මාර්ගය
(iii)රහතුන් වහන්සේලාගේ පැමිණීම.
(iv)පිරිබඩ - ගෑම / ආලේප කිරීම. ප්‍රණීණසට - පුන්කලස් (ලකුණු 4යි)

(ඊ)(i) ගනාන්ධකාරය සමග
(ii) සමුද්‍ර මන්දිර අභ්‍යන්තරයට (iii) රූපකයකි.
(iv)දිවසර - දිව්‍යස්ත්‍රින් රොසකොට - කෝප වී (ලකුණු 4යි)

(උ)(i) ජාතක කතා සංග්‍රහයේ සම්බුලා ජාතකයේ සඳහන්වන්නකි. සොත්තිසේන රජු සුවපත් වූ පසු සම්බුලා දේවියව නොසලකා හරින බව දැනගත් සෝත්තිසේන රජුගේ පියා විසින් සෝත්තිසේන රජුට පවසන්නකි. (ලකුණු 2යි)
(ii) රංජිත් ධර්මකීර්ති ලේඛකයාගේ ප්‍රදීපාගාරය යට කෙටිකතාවේ සඳහන්වන්නකි. කථකයා ඇතුළු පවුලේ සැම ප්‍රදීපාගාරය නැරඹීමට පැමිණි අවස්ථාවේදී ප්‍රදීපාගාරයට ආසන්නව පිහිටි කුඩා නිවසෙහි සිටි සමන්තිකා / දැරිය (කථකයා විසින් අසන ලද ප්‍රශ්නයකට) විසින් කථකයාට පවසන්නකි. (ලකුණු 2යි)
(iii)සද්ධර්මලංකාරයේ ආරක්‍ෂක අභය ස්ථවිර වස්තුවේ සඳහන්වේ. තෙරුන් වහන්සේ විසින් ආරක්‍ෂක සොරාට සත්කාර කරන අවස්ථාවේදී උපාසක පැමිණ සොරාගේ නුගුණ තෙරුන්වහන්සේට ප්‍රකාශ කරන අවස්ථාවේදී. (ලකුණු 2යි)
(iv)සද්ධර්මරත්නාලියෙහි මච්ඡරියකෝසිය සිටාණන්ගේ කතා වස්තුවෙහි සඳහන් කැවුම් කෑමේ ආශාව ඇති වූ සිටාණන් වෙනුවෙන් කැවුම් පිසීම සම්බන්ධ තොරතුරු විමසන අවස්ථාවේ / 'ඔබටත් මටත් පමණක් කැවුම් පිසමෝදැ'යි සිටුදේවිය විමසන විට මච්ඡරිය කෝසිය සිටාණන් විසින් සිටුදියණියට පවසන්නකි. ලකුණු 2යි)
(v) රත්නාවලී නාට්‍යයේ සඳහන් වේ. මැණික් මාලය දුටු විදූෂක සාගරිකාට මෙම මාලය ලැබුණේ කෙසේදැයි විමසන අවස්ථාවේ සුසංගකා විසින් විදූෂකට පවසන්නකි.
(vi)මළගිය ඇත්තෝ නවකතාවෙහි සඳහන් වේ. නොරිකො සං දෙවොංදරා සං ට ගෙදර ඒමට ආරාධනා කරමින් කරන කතාබහ අතරතුරදී නොරිකො සං විසින් දෙවොංදරා සං ට පවසන්නකි. (ලකුණු 2යි)
((ඌ) සමස්තය සලකා ලකුණු (රසවින්දනය) ලබා දෙන්න. - ලකුණු 16 යි)

**2 ප්‍රශ්නයේ සිට 8 ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලට සුදුසු උදාහරණ දක්වමින් අදාළ පිළිතුරු ලියා ඇති විට ඊට ගැළපෙන ලකුණක් පිරිනමන්න.**

## 13 ශ්‍රේණිය - සිංහල II

### පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. - 3 | 02. - 4 | 03. - 2 | 04. - 5 | 05. - 1 |
| 06. - 2 | 07. - 4 | 08. - 5 | 09. - 5 | 10. - 4 |
| 11. - 1 | 12. - 1 | 13. - 5 | 14. - 3 | 15. - 2 |
| 16. - 4 | 17. - 2 | 18. - 3 | 19. - 5 | 20. - 3 |

02. (අ) (i) කලා කෘතිවලට අනුග්‍රහය දැක්වීමේ ශක්තිය පල්ලියට පමණක් තිබීම.
මධ්‍යකාලීන චින්තනය ආගමික ඉගැන්වීම් පදනම් කොට ගොඩ නැගී තිබීම.
(ii) ආගමික බලපෑම් නිසා
(iii) කලාකරුවන්ට තම දක්ෂතා ඉස්මතු කරමින් ස්වාධීන නිර්මාණ බිහි කිරීමට හැකිවීම.
(iv) පෞද්ගලිකත්වය ඉස්මතු කෙරෙන කලා කෘති බිහිවීම නිසා.
(v) ලෞකික රසවින්දනය අගය කළ ධනවතුන්

03. වචන සංඛ්‍යාව 300 - 350 අතර විය යුතු ය. වචන 400 ට වැඩි වේ නම් හෝ
25 ට අඩුවේ නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු වේ.
වාක්‍ය රචනයට ලකුණු දීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
(i) ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශී වීම.
(ii) සංවිධානාත්මක බව
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
(viii) පැහැදිලි අත් අකුරු

04. (අ) (i) සංවිධාකයෝ සියල්ලෝ ම සභාපතිගේ තීරණයට එකඟ වූහ.
(ii) නිවැරදි වාක්‍යයකි.
(iii) කලාකරුවෝ ජනමන පුබුදු කරති.
(iv) ධනධනකු ලෙස ජීවත් වූ අමරසිරි දිළින්දෙකු ලෙස මිය ගියේ ය.
(v) සෑම අපරාධකරුවෙකු ම යම් සාක්ෂියක් ඉතිරි කරනු ඇත.

(ආ) (i) නාගරිකයන් විසින් දිළින්දන්ට ආහාර බෙදනු ලබයි / ලැබෙයි / බෙදෙයි.
(ii) ඇදුරාණන් විසින් තම සිසුහු අන්‍යයන්ට හඳුන්වා දෙනු ලබති / ලැබෙති / ලබන්නෝ ය / ලබන්නාහු / ලැබෙත්
(iii) වෙළෙන්දන් විසින් අයුතුලාභ ලබමින් භාණ්ඩ විකිණිනි / විකුණන ලදි/ විකුණන ලද්දේ ය / විකුණනු ලැබිණි / ලැබුවේ ය.
(iv) මී මැස්සන් විසින් නැවුම් පුෂ්පයෝ සිප ගැනෙති / ගනු ලබති / ලබත්
(v) වෛද්‍යවරයෙකු විසින් රෝගියා පරීක්ෂා කෙරෙයි / කරනු ලබයි / ලැබෙයි

ඉ) (i) කම්කරුවන් (ii) වූහ (iii) විකුණුවාය (iv) මිනිසුන් (v) අප

05. (අ) (i) ජාත්‍යන්ධ - උපතින් ම දැස් නොපෙනෙන
(ii) නිරවශේෂ - ඉතිරි නොකර
(iii) පරුපවාද - අන්‍යයන් නගන දොස්

(ආ) (i) විතරාගී (ii) පේකඩ / පෙතිකඩ (iii) අපරාජිත

(ඉ) (i) උපහාර (ii) උත්තමාචාර (iii) ප්‍රතිචාර (iv) කෘතඥ

(v) ප්‍රතිරාව (vi) ප්‍රියමනාප

(ඊ) අසුන් - ආසන (අශ්වයන්, පණිවුඩ, ලියුම්)

කල් - කාලය (කාන්තාව, යහපත්, කල්‍යාණ, භාර්යාව)

දා - දිනය (බැහැරකර, පිළිස්සී, ධාතු, දවස, ජානකය)

කර - දැඩි ලෙස රත්වීම (උරහිස, බෙල්ල, සිදුකොට, අත, අයබදු)

මද - ස්වල්පය (ගෙඩිවල / ඇට තුළ ඇති මදය, අනංගයා, ඇතුන්ගෙන් ගලන ශ්‍රාවය, මත්බව)

උර - උදව්ව (උදරය, පපුව, උරනවා, උරහිස, පසුම්බිය)

06. (i) බඳින - වර්තමාන කෘදන්ත

ද - අවධාරණාර්ථ / සමුච්චයාර්ථ / සම්බන්ධාර්ථ නිපාත

හතිලමින් - මිශ්‍ර / මුසු ක්‍රියාව

(ii) ඇදුරාණෝ - ගෞරවාර්ථ තද්ධිත

මව්පිය - දකාරාර්ථ සමාසය

සිසුන්ට - සම්ප්‍රදාන විභක්ති

(iii) ගුණවත් - අස්ථ්‍යාර්ථයේ / ඇත යන අර්ථයේ තද්ධිත

මාර්ගෝපදේශකයා - ස්වරාදේශ සන්ධිය

සීගිරි චිත්‍ර - විශේෂණ සමාසය / ආධාර විභක්ති සමාසය

(iv) වට - අතීත කෘදන්ත

වැස්සොත් - කරණ විභක්ති

ගංවතුර - ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

(v) සුදු මල් - විශේෂණ සමාස

ගෙන - පූර්ව ක්‍රියා

දැරියක් - අනියමාර්ථ තද්ධිත

07. (අ)(i) වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටුණා වගේ

(ii) කැලේ වෙනස් වුනාට කොටියාගෙ පුල්ලි වෙනස් වෙන්නේ නෑ වගේ

(iii) වෙහෙර ගිල්ල එකාට අග්ගලාව කජ්ජක් ද

(iv) අවාරයට කොළ දිවුල් වැටෙනවා වගේ

(v) තැනේ හැටියට ඇනේ ගහනවා වගේ

(vi) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ

(ආ)(i) උදව්කරනවා / අනුබල දෙනවා (ii) නින්දා කරනවා

(iii) උඩඟු වෙලා / ආඩම්බර වෙලා (iv) සිතු පරිදි වියදම් කරනවා

(v) සූදානම් වෙනවා (vi) කිසිවකුගේ අවධානයට ලක් නොවූ

(ඉ)(i) වෙනස් අර්ථ ඇති (ii) සමාන අර්ථ ඇති

(iii) විරුද්ධාර්ථ ඇති

(iv) වෙනස් අර්ථ ඇති

(v) මුල් පදයේ පමණක් අර්ථ ඇති

(vi) පසු පදයේ පමණක් අර්ථ ඇති

(ඊ)(i) නාදය (ii) කුඩා දැරිය (iii) වෙඩි තියනවා

(iv) හැංගෙනවා (v) රැසියා (vi) වේලාවක් / අවස්ථාවක්

(උ)(i) හේනේ රොඩු එකතු කිරීම

(ii) උදැල්ල

(iii) බිලිපිත්ත

(iv) කමතට දමන ගොයම් ප්‍රමාණය

(v) දේවාලයේ කපුවාගේ සේවකයා

(vi) රුවල් ඔරු

08. (i) ස්වකීය ජීවිතය පිළිබඳ වූ කල්හි ඉවසිල්ලෙන් තීරණය කොට ගෙන, ස්ථිරාධිෂ්ඨානයෙන් ස්ථානෝචිත ලෙස ක්‍රියාරම්භ කිරීමෙහි සුරු බුහුටි බව නම් ස්ත්‍රීන් විෂයෙහි නිසර්ග වශයෙන් පවත්නා බලයෙනි. ඒ හෙයින් මේ පවත්නා පුදුම ප්‍රවෘත්තියෙන් මේ නොකල්හි රජුගේ පැමිණිය පිළිබඳ ප්‍රවෘත්තියෙන් මොහොතක් පමණ කල් විඛිෂිප්තියෙන් බලා සිට, 'ඔව්, ඔව් ! අප අතර ද්‍රෝහියෙක් සිටියි. නැත්නම් කිසි කලෙකක්, මේ සේ අදිසියේ, මම කලින් නොදන්වා රජුට මෙහි පැමිණෙන්නට කිසි දා යුතුකමක් නැති දැන්, දැන් වැඩ හුගක් දුරට ම වරදිමි'යි හුදකලාව ම තොල් මතුරමින්, 'ඉතින් මිත්‍රවරුණි ! මෙය මා බලාපොරොත්තු නුවූ අදිසියකි. මේ මොහොතේ දී රජු මෙහි පැමිණීම සියල්ලන්ට ම නරකක් වන්නට පුළුවනි, ඒ හෙයින් තොප මෙහි සැඟ වී සිටිව්'යි'' කියමින් ඈ ඔවුන් රැගෙන ගොස් යා බද කාමරයක දමා දොර වැසුවා ය.

(විරාම ලකුණු ලකුණු 4යි, පද බෙදීම ලකුණු 3යි)

(ii) නිසඟී

(iii) ප් + ර් + අ + ව් + ඍ + ත් + ත් + ඉ + ය් + එ + න්

(iv) කොම්බුව, රකාරාංශය හල් කිරීම සහිත ඇලපිල්ල, ඉස්පිල්ල, හල් කිරීම.

(v) ස්ථිරාධිෂ්ඨානයෙන් (ලකුණු 2 x 4 = 8)